සැ. යු.-2008.04.11 දින පළ වූ අංක 1,545 දරන ගැසට් පත්‍රයේ II කොටස සහ III කොටස් පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,546 - 2008 අප්‍රේල් මස 18 වැනි සිකුරාදා - 2008.04.18

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡෛදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්ත= ... ... ... ... | 418 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 420 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවත් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 අප්‍රේල් මස 25 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයට යා යුතු දැන්වීම් 2008 අප්‍රේල් මස 11 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

415- B 079669 —9,445 (2008/04)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහූ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්ත දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

**රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය**

ලේකම් හා ගණකාධිකාරි තනතුර

රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමයේ ලේකම් හා ගණකාධිකාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ගෙන් (ස්ත්‍රී/පුරුෂ) අයදුම්පත් කැඳවනු ලැබේ.

(i). රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I පන්තියේ නිලධාරීන්,

(ii). කොළඹට සැතපුම් 30ක් ඇතුළත ස්ථිරව පදිංචිව සිටිය යුතුය,

(iii). 2008.07.01 දිනට වයස අවුරුදු 53ට අඩු විය යුතුය,

(iv). රාජ්‍ය සේවයේ අවුරුදු 15කට නොඅඩු සේවාවක් තිබිය යුතුය,

(v). ඉල්ලුම්කරුවන්ට සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් වැඩ කිරීමේ හැකියාව තිබිය යුතුය,

(vi). ගිණුම් හා පරිපාලන කටයුතු පිළිබඳව සුදුසුකම් හා පළපුරුද්දක් ඇති සංගමයේ සාමාජිකත්වය දරන අය කෙරෙහි හා දෙමළ භාෂාව ගැන දැනුමක් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

*තනතුරට අදාළ වැටුප.*—තෝරාගත් අයදුම්කරුට රාජ්‍ය සේවයේ දී ලැබූ වැටුප හා දීමනා ද ඊට අමතරව ඒකාබද්ධ වැටුපෙන් 50%ක අතිරේක දීමනාවක් ද ගෙවනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරු අවුරුදු 02ක (දෙකක) කාලයක් සංගමයේ සේවය සඳහා ද්විතියනය පදනම මත බඳවා ගනු ලැබේ. ඔහු විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ඇප ඔප්පුවක් මගින් රු. 10,000 ක රක්ෂණ ඇපයක් තැබිය යුතුය.

සියළු විස්තර සහිත අයදුම්පත් තමන්ගේ අත් අකුරින් සම්පූර්ණ කර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2008.05.28 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඩබ්. එල්. ටී. සුමතිරත්න,
සභාපති,
රජයේ නිලධාරීන්ගේ යහ සාධක සංගමය.

2008 අප්‍රේල් මස 18 වැනි දින,
රජයේ නිලධාරීන්ගේ යහ සාධක සංගමය,
65/1, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

04-396

---

**නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය**

නිශ්චල ඡායාරූප ශිල්පී III ශ්‍රේණිය

නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ III ශ්‍රේණියේ නිශ්චල ඡායාරූප ශිල්පී තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයෙහි සඳහන් පරිදි වූ අයදුම්පත් 2008.05.09 වැනි දිනට හෝ ඊට පෙර ලේකම්, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය, දෙවන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "නිශ්චල ඡායාරූප ශිල්පී III ශ්‍රේණිය - තනතුර" යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතුය.

සටහන .—(අ) මතු දැක්වෙන ආකෘතියේ ප්‍රකාර පිළියෙල නොවූ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) අයදුම්පත් තැපෑලේ දී නැතිවීම හෝ ප්‍රමාදවීම හෝ සම්බන්ධව කරනු ලබන පැමිණිලි පිළිබඳව සලකා බලනු නොලැබේ.

(ඇ) දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම් පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) මෙම තනතුර සඳහා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව 01කි. (එකකි).

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ)ඡේදයේ ආරම්භයේ දක්වා ඇති රාජ්‍ය සේවා පත්කිරීම් වලට අදාළ වන පොදු කොන්දේසි බල පවත්වනු ඇත.

(ඇ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීනත්වය නියමිත කාලය තුළ දී ලබා ගත යුතුය.

03. *වැටුප් හා දීමනා.*—තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය මෙසේය.

(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව (MT1-2006)

(ආ) රු. 14,000-10x120-11x140-6x210-14x290-රු.22,060 (III/II "ආ" ශ්‍රේණිය සඳහා අදාල වේ.)

(ඇ) තනතුරට පත්වී වසර 03ක් ඉක්ම යාමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය. වයස පදනම් කරගෙන කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු නොලැබේ.

04. අවශ්‍ය සුදුසුකම් :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත තැනැත්තෙකු වීම.

(ඇ) 2008.05.09 දිනට වයස අවුරුදු 18ට වැඩි වියයුතු අතර, වයස අවුරුදු 45ට වැඩි නොවීම. (දැනටමත් රජයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

05. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථය සහිතව විෂයයන්

06කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් විය යුතුය. (එක් වරකට අවම වශයෙන් විෂයයන් 05 කින් සමත් විය යුතුය.);

*හෝ*

(ආ) ඉහත විෂයයන් ඇතුළුව විෂයයන් 04කට සම්මාන සාමාර්ථය සහිතව ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06කින් සමත් විය යුතුය. (එක් වරකට අවම වශයෙන් විෂයන් 05කින් සමත් විය යුතුය.)

06. වෘත්තීය සුදුසුකම් :

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ කාර්මික විද්‍යාලයකින් හෝ රජයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් පිරිනමනු ලබන ඡායාරූපකරණය පිළිබඳව ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබිය යුතුය.

*හෝ*

(ආ) රජය පිළිගත් වෘත්තීය අධ්‍යාපන ආයතනයකින් පිරිනමනු ලබන ඡායාරූපකරණය පිළිබඳ එක් අවුරුද්දකට නොඅඩු පූර්ණකාලීන හෝ දෑ අවුරුද්දකට නොඅඩු අර්ධකාලීන වෘත්තීය පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබිය යුතුය.

07. පළපුරුද්ද :

ඡායාරූප ශිල්පියෙකු වශයෙන් වසර 05ක පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුයි.)

08. බඳවා ගැනීමේ ක්‍රමය :

සම්මුඛ පරීක්ෂණයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදුකෙරේ.

ඩබ්ලිව්. බී. ගනේගල,
ලේකම්,
නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය.

2008 අප්‍රේල් 01 වැනි දින,
නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය,
දෙවන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

**නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය**

***නිශ්චල ඡායාරූප ශිල්පි III ශ්‍රේණිය තනතුර සඳහා අයදුම්පත***

01. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :———.

මහතා/මහත්මිය/මෙනවිය

02. මුලකුරු සමග නම :———.

03. ලිපිනය (ලිපිනය වෙනස් වුවහොත් ඒ බැව් වහාම දැන්විය යුතුය.) :———.

(අ) පෞද්ගලික ලිපිනය :———.

දුරකථනය අංකය :———.

(ආ) කාර්යාලයීය ලිපිනය :———.

දුරකථනය අංකය :———.

04. (අ) උපන් දිනය :-

| වර්ෂය | | | | | මාසය | | | දිනය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|

(ආ) ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනට වයස :-

| අවුරුදු | | | මාස | | | දින | | |
|---|---|---|---|---|---|---|---|---|

(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

05. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :-

06. (අ) ස්ත්‍රී/පුරුෂ භාවය :———.

(ආ) විවාහක/අවිවාහක බව :———.

07. පහත සඳහන් විෂයයන්ගෙන් සමත් උසස්ම පරීක්ෂණය.

1. සිංහල
2. දෙමළ
3. ඉංග්‍රීසි

08. අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් :

8.1 අ. පො. ස. (සා. පෙ.)/ජා. පො. ස.

වර්ෂය :———. විභාග අංකය :———.

| | *විෂයයන්* | *ශ්‍රේණිය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

8.2 අ. පො. ස. (උ. පෙ.)

වර්ෂය :———. විභාග අංකය :———.

| | *විෂයයන්* | *ශ්‍රේණිය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

8.3.

| උපාධිය/ඩිප්ලෝමා | වර්ෂය | විෂයයන් |
|---|---|---|
| | | |

09. දැනට රැකියාවක නිරතව සිටී නම් ඒ පිළිබඳ විස්තර :

| ආයතනය | තනතුර | සිට | දක්වා | වාර්ෂික වැටුප |
|---|---|---|---|---|
| | | | | |

10. වෘත්තීයට අදාළ වෙනත් සුදුසුකම් :———.

11. ඔබ යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියක දී වරදකරු වී ඇති ද යන වග :———.

12. ඔබ මීට පෙර රජයේ සේවයෙහි නියුක්තව සිටියෙහි ද? :———.

(එසේ නම් විස්තර සඳහන් කරන්න.)

13. පහත සඳහන් සහතික වල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා ඇත.

(අ). උප්පැන්න සහතිකය,

(ආ). අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික,

(ඇ). වෘත්තිය සුදුසුකම් පිළිද සහතික,

(ඈ). පළපුරුද්ද පිළිබඳ සහතික.

14. ඔබ ගැන තොරතුරු විමසා දැන ගත හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :-

(දුරකථන අංක සමග)

1. ———.

2. ———.

15. අදාළ වෙනත් තොරතුරු :-

16. මෙම අයදුම්පත්‍රයෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරැදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට ඉඩ ඇති බවත්, පත් කිරීමෙන් පසු ඒ බව දැන ගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබිය හැකි බවත් මම දනිමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

17. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

(අයදුම්කරු රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නම් පමණි)

....................මහතා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු බව ද ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බව ද මෙම නිවේදනයේ දැක්වෙන පරිද මෙම තනතුරට අදාළ සුදුසුකම් සපුරා ඇති බව ද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද මෙයින් ප්‍රකාශ කර සිටිමි.

———.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා පදවිය.

දිනය :———.

04-515

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව

### ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීම - 2008 වර්ෂය

පහත සඳහන් අවම සුදුසුකම් ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම 2008 වර්ෂය සඳහා ලං.ජ.කා. අ. ආයතනයට ඇතුළත් කර ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

1. (අ) වයස : 2008.03.31 වැනි දිනට වයස අවුරුදු 16ත් 22ත් අතර විය යුතුය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී (අධ්‍යාපන මාධ්‍යය) අනුව සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් 06ක් එකවර සමත්වීම.

සැ. යු. : පහත නම් සඳහන් පුහුණු ආයතනවල දැනට පූර්ණ කාලීන පාඨමාලා හදාරන ආධුනික/ ආධුනිකාවන්ට මෙම පුහුණුව සඳහා ඉල්ලුම් කළ නොහැක.

i. ආධුනිකත්ව අභ්‍යාස ආයතනය - මොරටුව

ii. මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, - ඔරුගොඩවත්ත

iii. ලංකා ජර්මන් දුම්රිය අභ්‍යාස ආයතනය, - රත්මලාන

2. ඇතුළත් වීමේ විභාගය
පවත්වන මාධ්‍යය : සිංහල සහ දෙමළ භාෂා වලින්

පුහුණු කිරීමේ උපදෙස් : සියලුම පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පවත්වන අතර දැනට තිබෙන පහසුකම් අනුව මෝටර් කාර්මික ශිල්පය පමණක් දෙමළ මාධ්‍යයෙන් ද පැවැත්වේ.

3. *විභාග මධ්‍යස්ථාන* :

පහත සඳහන් ආදර්ශ අයදුම්පත් පෝරමය අනුව අයදුම්කරන අය සඳහා ලිඛිත පරීක්ෂණයක් කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල සහ අනුරාධපුරය යන විභාග මධ්‍යස්ථානවලදී පැවැත්වේ. එහෙත් මීට අමතරව යම් පළාතක විභාග අයදුම්කරුවන් 100කට වැඩි ප්‍රමාණයක් සිටී නම් එම පළාතේ විභාග මධ්‍යස්ථානයක් පැවැත්වීමට කටයුතු කරනු ඇත. අවශ්‍ය අවම සුදුසුකම් සපුරා හා අංක 04 සඳහන් විභාග ගාස්තු එවා ඇති අයදුම්කරුවන් පමණක් ඇතුලත් කිරීමේ විභාගයට කැඳවනු ලැබේ.

විභාගයට අදාල විෂයයන් :

ඇතුළත්වීමේ විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර ගණිතය, සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය සහ කාර්මික ඇඳීම යන විෂයයන් පදනම් කර සකස් කරනු ලැබේ.

4. *විභාග ගාස්තු* : විභාග ගාස්තු වශයෙන් රු. 350ක් ගෙවිය යුතුය. එම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවිය හැක.

*ගෙවන ක්‍රමය* : ගණකාධිකාරී, ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය, ලංකා බැංකුව, මොරටුව ශාඛාවේ ගිණුම් අංක 681490 දරන ගිණුමට මුදල් බැර කල යුතුය.

ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගිණුම් අංක 6814900ට රු. 350ක් ගෙවා ලබාගත් රිසිට් පත අයදුම් පත්‍රයට අමුණා එවිය යුතුය.

ඉහත මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සියට අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඇතුලත්වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව විශේෂයෙන් සැලකිය යුතුය.

5. *මූලික තෝරාගැනීම* :

ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතා පදනම මත සීමිත සංඛ්‍යාවක් අවසාන තෝරාගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. යෝග්‍යතා සහ සම්මුඛ පරීක්ෂණයට අයදුම්කරුවන් කැඳවීමේදී අඩු පහසුකම් සහිත පළාත් සඳහා ලැබිය යුතු ඉහළම ලකුණු මට්ටම පාලක මණ්ඩලය මගින් තීරණය කරනු ලැබේ. (අඩු පහසුකම් ඇති ප්‍රදේශ ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිර්දේශ කරනු ලබන පළාත් පමණක් සලකනු ලැබේ.)

6. *අවසන් තෝරා ගැනීම* :

යෝග්‍යතා/සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ඉහළම ලකුණු ප්‍රමාණය මත බඳවා ගනු ලබන සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. යෝග්‍යතා පරීක්ෂණය සඳහා 40%ක් ද, සම්මුඛ පරීක්ෂණයෙන් 60%ක් ද, ලබාගත හැකිය. බාහිර කුසලතා කෙරෙහි විශේෂ සැලකිල්ලක් සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලැබේ. පුහුණුව සඳහා ආයතනයට බඳවා ගත හැකි සංඛ්‍යාව සීමිත බැවින් අදාල පරීක්ෂණයන්ගෙන් සමත්වන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයට යටත්ව පුහුණුව සඳහා තෝරාගනු ලබන අතර, වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත්වන අයදුම්කරුවන් පුහුණුවෙන් ඉවත් කරනු ලබන බව සැලකිය යුතුයි.

7. *පුහුණු පාඨමාලා* :

| | |
|---|---|
| මෝටර් කාර්මික ශිල්පය | - අවුරුදු 04 |
| මිල්රයිට් වැද්දුම් ශිල්පය | - අවුරුදු 04 |
| වායු සමීකරණ/ශීතකරණ ශිල්පය | - අවුරුදු 03 1/2 |
| බල විදුලි ශිල්පය | - අවුරුදු 03 1/2 |
| යාන්ත්‍රික ශිල්පය | - අවුරුදු 03 1/2 |
| ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පය | - අවුරුදු 03 |
| වාහන විදුලි ශිල්පය | - අවුරුදු 03 |
| පෑස්සුම් ශිල්පය | - අවුරුදු 03 |
| මෝටර් වාහන පින්තාරුකරු හා බොඩි අලුත්වැඩියාකරු | - අවුරුදු 03 |

මෙම පුහුණු පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දෙනුයේ ප්‍රථම වසරේදී මූලික පුහුණු පාඨමාලාව අවසානයේ පැවැත්වෙන වෘත්තීය තෝරා ගැනීමේ පරීක්ෂණයේදී ලබන කුසලතා ප්‍රතිඵළ අනුවය.

8. *ගිවිසුම් අත්සන් කිරීම* :

ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන්ට ලැබෙන ඒ ඒ වෘත්තීන්ට අදාලව අවුරුදු 04, 03 1/2 සහ 03ක් වූ පාඨමාලා සාර්ථකව හදාරන බවට මෙම ආයතනය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමග ගිවිසුම් වලට අත්සන් තැබිය යුතුය.

9. *අයදුම්පත්* :

පහත දැක්වෙන අයදුම්පත් පෝරමයට අනුව තම අයදුම්පත්‍රය පිළියෙල කොට අධ්‍යාපන සහතිකයේ පිටපතක් ද අමුණා ගල්කිස්ස, ගාලු පාරේ, අංක 582 හි ලංකා-ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ, කළමනාකාර - මානව සම්පත් හා පරිපාලන වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "පූර්ණකාලීන ආධුනික බඳවාගැනීම - 2008" යනුවෙන් සඳහන් කළ යුතු අතර සෑම අයදුම්පතක්ම මි. මී. 210 x 297 (ඒ4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ගත යුතුයි.

10. *අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය* :

අයදුම්පත් 2008.05.30 වන දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කළමනාකාර - මානව සම්පත් හා පරිපාලන,
ලං.ජ කා. අ. ආ.

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය,
582, ගාලු පාර, ගල්කිස්ස.
(අඟුලාන හංදිය අසල)
දුරකථන අංකය : 0112605625

**ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව**

**ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීම - 2008 වර්ෂය**

1. (අ) සම්පූර්ණ නම (සිංහලෙන්) :————.
(ඉංග්‍රීසියෙන්) :————,

(ආ) මුලකුරු සමග නම :————.

2. (අ) තැපැල් ලිපිනය :————.
(ඉංග්‍රීසියෙන්)

(ආ) දිස්ත්‍රික්කය :————. (ඇ) පළාත :————.

3. (අ) උපන් දිනය :—————.

(ආ) 2008.03.31 වැනි දිනට වයස ඃ
අවු. :—————. මාස :—————. දින :—————.

4. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

5. අධ්‍යාපන සුදුසුකම් : අ.පොස. (සා.පෙළ) විභාගයෙන් සමත් විෂයයන්

විභාග අංකය :—————.

වර්ෂය :—————.

| විෂයයන් | සාමාර්ථය | | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|---|---|
| 1. ————— | ————— | | 5. ————— | ————— |
| 2. ————— | ————— | | 6. ————— | ————— |
| 3. ————— | ————— | | 7. ————— | ————— |
| 4. ————— | ————— | | 8. ————— | ————— |

6. ජාතික හෝ තැපැල් හැඳුනුම් පත් අංකය :—————.

7. (අ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති මාධ්‍යය :———.

(ආ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති විභාග මධ්‍යස්ථානය :—————.
(කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, අනුරාධපුර )

8. 1. මුදල් ගෙවූ ලංකා බැංකු ශාඛාවේ නම :—————.

2. මුදල් ගෙවූ දිනය :—————.

9. ඉහත සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් විස්තර වලින් යමක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව මා තෝරා ගැනීමට පෙර හෝ තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හැකි බව දනිමි.

—————.
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :—————.

04-442

---

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය — ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය — 2008

බලයලත් සැළසුම් ශිල්පියෙකු ලෙස වෘත්තියේ යෙදීමට සර්වේයර් ජනරාල්ගේ සහතික පත්‍රය නිකුත් කිරීම සඳහා වන විභාගය කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය කොටස් දෙකකින් සමන්විත වේ.

I වැනි කොටස - බණ්ඩාංක පත්‍ර පිළියෙල කිරීම
II වැනි කොටස - පිඹුරු ඇඳීම

2. විභාගයේ පළමුවැනි කොටස 2008 ජුනි මස 21 වැනි දිනද, දෙවැනි කොටස 2008 අගෝස්තු මස 30 හා 31 යන දිනයන්හි දී ද පැවැත්වෙනු ඇත. පළමු වැනි කොටසින් අසමත් වන අපේක්ෂකයින්ට දෙවැනි කොටසට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගයේ කොටස් දෙකෙන්ම එකවර සමත් වන අපේක්ෂයින්, බලයලත් සැළසුම් ශිල්පීන් සඳහා වන සර්වේයර් ජනරාල් ගේ සහතිකය ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

3. විභාගයේ දී, අපේක්ෂයින්ට පහත සඳහන් දෑ කල හැකි බවට මා හට ඒත්තු ගැන්විය යුතුය ඃ

(අ) ක්ෂේත්‍ර සටහනක් මගින් බණ්ඩාංක පත්‍රයක් නිවැරදිව පිළියෙල කිරීමට හා පරික්‍රමණයක් බණ්ඩාංක කිරීමට,

(ආ) කෝණමානය භාවිතයෙන් හා බණ්ඩාංක ආධාරයෙන් නිවැරදිව පිඹුරක් නියැකීමට හා ක්ෂෙත්‍රඵලය ගණනය කිරීමට.

4. පහත දැක්වෙන ආදර්ශය අනුව පිළියෙල කර ගත් අයදුම් පත්‍ර රු. 300.00 ක් වටිනා මුදල් ඇණවුමක් හෝ දියතලාව, මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයට මුදල් ගෙවා ලබා ගත් රිසිට් පතක් සමඟ ජ්‍යෙ. මිනින්දෝරු අධිකාරි (විභාග), මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය, දියතලාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මුදල් ඇණවුමේ ගෙවීම් ලබන්නා "ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (මැනුම් පුහුණු ආයතනය)" ලෙසද, ගෙවන කාර්යාලය "දියතලාව" ලෙසින්ද සඳහන් කල යුතුය. එසේම රිසිට් පතේ මුල් පිටපත හෝ මුදල් ඇණවුමේ මුල් පිටපත අයදුම් පත්‍රය සමග අමුණා එවිය යුතුය. (කරුණාකර රිසිට් පත හෝ මුදල් ඇණවුම අයදුම් පත්‍රයේ අලවා නොඑවන්න.) කවරයෙහි වම්පස ඉහල කෙළවරේ "බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස ස. ජ. ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2008" යනුවෙන් සඳහන් කරන්න. මුද්දර මගින් හෝ චෙක්පත් මගින් කරනු ලබන ගෙවීම් භාරගනු නොලැබේ.

5. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු කුමන හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.

6. අයදුම්පත් 2008 මැයි මස 25 දින හෝ ඊට පෙර එවිය යුතුය. එදිනට පසු එවනු ලබන අයදුම්පත් භාර ගනු නොලැබේ.

7. බණ්ඩාංක පත්‍ර හා ඇඳීම් කඩදාසි විභාග ශාලාවේදී සපයනු ලැබේ. කෙසේ වෙතත් අයදුම්කරුවන් විසින් ඇඳීම් උපකරණද, බණ්ඩාංක ගණනය කිරීමට අවශ්‍ය ගණිත වගු යනාදියද, අවශ්‍ය අනෙකුත් සියළු උපකරණද රැගෙන ආ යුතුය. විභාග ශාලාධිපති ගේ අවසරය ඇතිව මෘදුකාංග රහිත සාමාන්‍ය විද්‍යාත්මක ගණක යන්ත්‍ර භාවිතා කිරීමට ඉඩ දෙනු ලැබේ.

8. (i) සෑම විභාග අපේක්ෂකයෙකුම විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් එකක් ඉදිරිපත් කළ හැකිය ඃ

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත,

(ආ) වලංගු ගමන් බල පත්‍රයක්,

(ඇ) විභාගය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුලත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයදුම්කරුගේ ඡායාරූපයක් ද සහිත බලපත්‍රයක් හෝ අනන්‍යතා ලියවිල්ලක්.

(ii) ඉහත 8(i) හි පරිදි තමන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

9. මෙම විභාගය මෙට්‍රික් ඒකක ක්‍රමය යටතේ පැවැත්වෙනු ඇත.

බී. ජේ. පී. මෙන්ඩිස්,
සර්වේයර් ජනරාල්.

2008 මාර්තු මස 31 වැනි දින,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ. පෙ. 506, කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත**

***ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව***

*බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2008*

විභාග අංකය : [ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(අ) (i) මුලකුරු සමග නම :————— මයා/මිය/මෙනවිය.

(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම් :—————.

(iii) මුලකුරු සමග නම පැහැදිලිව ඉංග්‍රීසියෙන් :—————.

(ආ) ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

(ඇ) තනතුර :—————.

(ඈ) රැකියා ස්ථානයේ ලිපිනය :—————.

(ඉ) ස්ථිර ලිපිනය :—————.

(ඊ) උපන් දිනය :—————.

(උ) අධ්‍යාපන සුදුසුකම් :—————.

(ඌ) විභාගයට පෙනී සිටින මාධ්‍යය : (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)

(එ) ගෙවන ලද ගාස්තු :—————.

(ඒ) මුදල් ඇණවුම්/රිසිට්පත් අංකය :—————.

නිකුත්කළ කාර්යාලය :—————.

දිනය :—————.

(ඔබ විසින් දියතලාව, මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයට මුදල් ගෙවන ලද්දේ නම් එම රිසිට් පත හෝ මුදල් ඇණවුමක් මගින් එවන්නේ නම් එම මුදල් ඇණවුමේ මුල් පිටපත හෝ අමුණා එවිය යුතුය.)

මවිසින් ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි හා සත්‍ය තොරතුරු බව සහතික කරමි.

—————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

04-539